ශ්‍රී ලංකාවේ අගනගරය වන කොළඹ නගරය තුළ හැදී වැඩුණු දරුවකු වශයෙන් උත්පල ඉරොෂාන් හට උඩරට නැටුම හා බෙර වාදනයේ ඇසුර හොඳින් ලැබී තිබිණි. "**මම පොඩි කාලයේ ඉඳලම සිංදු අහන්න වගේම නැටුම් බල්න්න් හරිම කැමතියි.අප පාසලේ හයවන ශ්‍රේණියට යද්දී අපිට කලා විෂයන් තෝරා ගැනීමේ අවස්ථාව හිමි වුනා.එහිදී මම තෝරා ගත්තේ නර්ථන විෂයයි.එතැන්සිට පුරා වසර හතරක් පාසල තුළ නර්තනය හැදෑරුවා**". තම මිතුරන් සමග කලා මෙන්ම ක්‍රීඩා කටයුතු වලට සම්බන්ධ වුවත් උත්පල කා අතරත් කැපී පෙනුනේ ස්භාවයෙන්ම ඔහු තුළ තිබූ නර්ථන හැකියාව හා අනෙකුත් කලා හැකියාවෙන් හේතුවෙනි.පාසලේ නර්ථන ගුරුතුමා ඔහුගේ බෙර වාදනයේ අත්පොත් තැබිමට උපකාර කළේය. "**කලාත්මක දේවල් වලට මම ගොඩාක් සම්පයි. මගේ පියාත් කලාකාරයෙක් ඔහු වෘත්තිය චිත්‍ර ශිල්පියෙක් ඒ වගේම ඉන්දියානු සංගිතය පිළිබඳව දැනුමක් හා ඉන්දියානු බෙර, ගිටාරය, වයලීනය වැනි සංගීත භාණ්ඩ වාදනය කිරිමේ හැකියාවක්ද ඔහු හට තිබුණා. ඔහුගේ ආභාෂය මාවත් කලාවටම නැඹුරු කරනන් ලොකු හේතුවක් වුනා**".

පාසල් අධ්‍යාපනයෙන් පසුව උඩරට නර්ථනය හා බෙර වාදනය හැදෑරිම සඳහා ලංකාවේ සිටින දක්ෂ ප්‍රසිද්ධ නර්ථන ආචාර්‍ය වරයෙකු වන රවි බන්දු විද්‍යාපති ගුරුතුමා වෙතට ගිය උත්පල හට පසු කාලීනව එම නර්ථනාචාර්‍ය වරයා විසින් පවත්වාගෙන ගිය නර්ථන පුහුණු පාසලේ ගුරුවරයෙකු වශයෙන් කටයුතු කිරිමට හැකියාව ලැබිණි, තවද තම ගුරුවරයා කණ්ඩායම සමග ලංකාව පුරා ගොස් ප්‍රසංග පවත්වා තම දක්ෂතා ඉදිරිපත් කිරිමටත් ඔහුට හැකියාව ලැබිණි. පසුව ලංකාවේ ජනප්‍රිය වාදන කණ්ඩායමක් වන නාද්රෝ හි සාමාජිකයෙකු ලෙස එක්විමටද උත්පල වසානාවන්ත වුවා. "**නාද්රෝ කියන්නේ ලංකාවේ ඉන්න දක්ෂම බෙර වාදන කණ්ඩායමක් එතනදී තමයි මට රබිත වික්‍රමරත්න කියන ලංකාවේ ඉන්න එක් දක්‍ෂතම බෙර වාදන ශිල්පියෙක්ව හඳුන ගන්න ලැබුණේ, ඔහුත් සමග එම කණ්ඩායමේ ගත කරපු වසර අටක පමණ කාලය තුළ ඉන්දියානු, ලතින් වැනි විවිධ වූ සංගීත රටා ගැන හදාරන්න වගේම විවිධාකාර බෙර වර්ග වාදනය කරන්න අවස්ථාව ලැබුණා. එපමණක් නොවේ විවිධ රටවල සංචාරය කරමින් ප්‍රසංග පැවැත්විමටත් ඒ සංචාර වළදී විවිධ රටවල කලා කරුවන් හමුවිමට වගේම ඔවුන්ගෙන් ඉතා වටිනා දේවල් ඉගෙන ගන්නටත් හැකියාව ලැබුණා**".

උත්පල බෙරවාදනය පිළිබඳව කථා කරන විට පවා ඔහුගේ මුවේ සිනහවක් ඇඳී තිබුණා. එයට හේතු විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ, "**ඇත්තටම මම බෙර වාදනය කරන විට මට මමම වෙන්න පුළුවන්. මම හිතන දේ මගේ දැත් වලින්  වින්දනය හරහා එළියට එනවා. ඒ නිසා මම හිතන දේ බෙර වාදනය ඔස්සේ අනිත් අයට පෙන්වන්න මට පුළුවන්**". උඩරට බෙරවාදනය හා නර්ථනය යනු අන්‍යයන් පිනවිම මෙන්ම රජුන් දෙවියන් බුදුන් වැනි ශ්‍රේෂ්ඨයන්ට බුහුමන් දැක්විම සඳහාද නිර්මාණය වුවක්. බෙර වාදනය කිරිමෙන් ඔහු ඉතා වටිනා ගෞරවණීය පාරම්පරාගත ශාස්ත්‍රයන් පවත්වානෙ යාම පමණක් නොව තමන්ගේම දේකුත් එය තුළට එක් කිරිමට වග බලා ගන්න.ඒ නිසා සම්ප්‍රදාය දරන්නෙකු මෙන්ම එයට යමක් එක්කරන්නෙකුද විමේ භාග්‍ය ඔහුහට හිමියි.

උත්පල වර්තමානයේ බෙර වාදන ගුරුවරයෙකු ලෙසින් කටයුතු කරමින් සිටී. දක්ෂ බෙර වාදයෙක් පමණක්ම නොවී බෙර වාදන ආචාර්යවරයෙකු බවට පත්විම කෙරෙහි ඔහුගේ අවධානය යොමුවිමට හේතු විමසූ විට ඔහු කියා සිටියේ, "**අපි උඩරට නර්ථනය හදාරනවානම් කළයුතු දේවල් කිහිපයක් තියනවා. මුලින්ම කළ යුත්තේ අන් අයට, වැඩිහිටියන්ට ගරු කිරිම ඉගෙන ගැනිමයි. ඒ වගේම නිතරම දෙවියන් බුදුන් හා ගුරුවරුන්ගෙන් අශිර්වාදය ප්‍රාර්ථනා කිරිම වැදගත්. දෙවනුව කළ යුත්තේ මෙය විශය පථයක් වශයෙන් ආරක්‍ෂා කර ගැනිමයි. මෙය විශයක් ලෙස ආරක්‍ෂා නොවුනොත් ඉදිරි පරපුරට හැදෑරිමට දෙයක් නැති වෙනවා. මෙම සම්ප්‍රදාය විෂයන් වශයෙන් ආරක්‍ෂා කරගෙන මතු පරම්පරාවට ඉගැන්විම වගකිමක් අපටත්**

**තියනවා. සම්ප්‍රදායික උඩරට නර්ථන හා බෙර වාදන ගුරුවරයෙකු තමන්ගේ ශිෂ්‍යන්ට ශිල්පීය ඥාණය දීමට කලින් විවිධ වූ දේ සිදුකිරිමට උපදෙස් දෙනවා.ඒ දෙවල් මගින් මූලිකව සිදුකෙරෙන්නේ ශිෂ්‍යන්ගේ අවධානය පවත්වා ගැනිමට මෙන්ම ඉවසිම පුහුණු කිරිමයි".** ඇමරිකා එකසත් ජනපදය තුළ නම් මෙවැනි ක්‍රමවේදයන් අනුගමනය කිරිම අපහසු වුවත් උත්පල හැකි පමණ උත්සහ කරන්නේ තමන්ගේ ගුරුහරුකම් ලබන්නන් හට හොදම දේ ලබාදිමයි.

උඩරට නර්ථනය හා බෙර වාදනය මූඛ පරම්පරාගත පැවත එන්නක් ඒ නිසා එය හදාරන්නේ නම් හොද ආචාර්‍යවරයෙකු යටතේ හැදැරිමේ වැදගත් කම ගැනද උත්පල මෙසේ සදහන් කලා. "**මේ සම්ප්‍රදාය ඉතිහාසය කොහේවත් ලියවිලා නැහැ. හැමදේම පැවතගෙන එන්නේ මූඛ පරමාපරාගතවයි. ඒ නිසා මෙම සම්ප්‍රදාය හා ඉතිහාසය නිවරදි ලෙස හදුනන ගුරුවරයෙකු තෝරා ගැනිම වඩාත් වැදගත්**". බෙර වාදනය ඉතා ඈත අතීතයේ සිටම ලංකාවේ සංස්කෘතිය හා බැදි පවතින්නක්. උදාහරණයක් වශයෙන් පුරාණ රජවරු යම් පණිවිඩයක් සමාජගත කිරිම සදහා අණබෙරය යොදා ගැනිම ගත හැකිය. අණබෙරකරුවා රජුගේ පණිවිඩය රුගෙන ගමින් ගමට ගොස් තමන්ගේ බෙරය වාදනය කොට ගැමියන් ඒකරාශි කරවා පණිවඩය දැනුම් දෙයි. අණබෙරය කණ වැකුණු විගස එය රජුගේ පණිවිඩයක් බවට තේරුම් ගැනිමට ගැමියන් පුරුදුව සිටියා. තවත් එක් උදාහරණයක් වන්නේ සිංහල අලුත් අවුරුද්දට රබන් වාදනය කිරිමයි. මෙහිදි ඉතා විශාල රබානක් කිහිප දෙනෙකු එක්වි එකවර වාදනය කිරිම සිදු කෙරෙනවා. වැඩිහිටියන් විසින් රත්කොට පදම් කරගත් රබාන විවිධ රිද්මයන් ඔස්සේ වාදනය කරමින් ගායනයෙහි යෙදිම මෙහිදි සිදුකරනවා.

උඩරට බෙර නිර්මාණය කරනු ලබන්නේ ක්‍රමාණුකූල ක්‍රමවේදයන් අනුගමනය කරමිනුයි. බෙර වල සුවිශේශී නාදරටා ලබා ගැනිම සදහාම විශේෂ වූ ලී වර්ග හා සම් වර්ග භාවිතා කෙරෙනවා. ගැට බෙරය යනු දෙපස සම් යොදා සාදාගත් ඕවල ආකාර හැඩයකින් යුතු බෙරයක්. මෙහි වම්පසට හරක් සම හා දකුණු පසට එලු හම යොදා ගැනෙනවා. අතීතයේදි නම් මේ බෙරය සදහා යොදා ගත්තේ වදුරු සම හා මුව සම් උනත් දැන් ඒ සම් යොදා ගැනිම නීතියෙන් තහනම් කර තිබෙනවා. "**බුද්ධ ධර්මය අදහන රටක් වශයෙන් අප මස් මාංශ ආහාරයට ගැනිම හෝ කුමන ඇසුරකින් සතුන් මැරිම නොකළ යුතු බවත් බෞද්ධ ඉගැන්විමයි. ඒ නිසා එම ඉගැන්විම වලට ගරු කරන ස්භාවික ලෙස මියගිය සමතුන්ගේ සම් බෙර සදහා යොදා ගැනෙනවා**".

අවසාන වශයෙන් උඩරට සම්ප්‍රදාය අනුගමනය කරන්නෙකු හා එය මතුපරපුරට දායද කරන්නනෙකු වශයෙන් උත්පල තුළ ඇත්තේ මෙවන් අදහසක්.

**"කලාකාරයෙක් කියන්නේ තමන්ට විතරක් නොවේ. අන් අයටත් සතුට බෙදාදෙන කෙනෙක් මම හිතන විධියට කුමක් හෝ කලා කටයුත්තකට සම්බන්ධ වුන කෙනෙකුගේ සිත නිසංසලයි . මම කැමතියි කියන්න ගොඩක් දෙනෙකුට නොමැති හැකියාවක් ලැබිම ගැන මම ඉන්නේ ඉතාම සතුටින් බව. වැඩමුළු පැවැත්විම, ඉගැන්විම, ප්‍රසංග පැවැත්විම ආදි ඕනෑම යෙක් මාර්ගයෙන් මම දන්නා දේ තවත් කෙනෙකුන් සමග බෙදා ගන්න මම කැමතියි. මම නර්ථනයේ යොදන විට හෝ බෙර වාදනය කරන විට මාගේ සිතට ඇතිවන සතුට අන්අය සමග බෙදා ගන්න මම කැමතියි. මම විශ්වාෂ කරන විධියට ලෝකය ලස්සන වෙන්නේ ලස්සන පිවිතුරු හදවත් තියෙන මිනිසුන් නිසා".**